**එක්සත් සමාජවාදී පක්ෂය විසින් ඉදිරි මැතිවරණ සඳහා ඉදිරිපත් කරන වැඩ පිළිවෙල**

**ආර්ථිකය ගොඩනැගීම සඳහා ගනු ලබන පියවරයන්**

• ශ්‍රී ලංකාව මුහුණ දෙන ආර්ථික අර්බුදයේ ගැඹුරු ස්වභාවය තේරුම් ගනිමින් ඊට විසඳුම් සපයන කෙටිකාලීන, මධ්‍ය කාලීන හා දිගු කාලීන අවබෝධයකින් යුක්තවූ හදිසි ආර්ථික සැලැස්මක් ක්‍රියාත්මක කිරීම

• IMF, India, China ඇතුලු විදේශීය රට වලට ණය ගෙවීම ප්‍රතික්ෂේප කිරීම හා දේශීය ගොවීන්, ධීවරයන්ගේ සහ කුඩා ව්‍යාපාරවල ක්ෂුද්‍ර ණය ඇතුළු සියලුම දුගී ජනතාව ලබා ගෙන තිබෙන ණය වහාම අවලංගු කිරීම හා ඒ සමග මතුවිය හැකි අභියෝග වලට මුහුණ දීම වෙනුවෙන් ලංකීය සමාජය පෙළ ගැස්සවීම.

• චීනය/ඉන්දියාව/බටහිර රටවල් ඇතුලු ප්‍රකෝටිපතියන් සමග රටට අහිතකර ලෙස ඇති කර තිබෙන සියලුම ගිවිසුම් ආපසු හැරවීම ආරම්භ කිරීම.

• අධ්‍යාපනය, සෞඛ්‍ය සහ බලශක්තිය ක්ෂේත්‍ර වල දැනට සිදුවෙමින් පවතින සියලුම පුද්ගලීකරණ ක්‍රියාදාමය ආපසු හැරවීමට පියවර ගැනීම.

• නව ලිබරල්වාදී වැඩ පිළිවෙලට අනුව සිදුවන ජාතික සම්පත් දේශීය හා විදේශීය ජාවාරම් කරුවන්ට විකිණීම නවතා දමන අතර මහ බැංකුව ඇතුළු බැංකු, රක්‍ෂණය, වරාය හා ගුවන් තොටුපල වැනි ආර්ථිකයේ ප්‍රධාන බල මධ්‍යස්ථාන ප්‍රජාතන්ත්‍රවාදී කම්කරු පාලනයක් යටතේ ජනසතු කිරීම.

• ගොවීන් හා ධීවරයින් වැනි අඩු ආදායම් ලාභීන් සඳහා ලබාදෙන අත්‍යවශ්‍ය ආහාර සහනාධාරය වැඩි කිරීම. ලක්‍ෂ 40ක් ලෙස ගනනය කර තිබෙන රැකියා විරහිත සහ දුප්පත් පවුල් සඳහා ප්‍රමාණවත් සහනදායි වැඩ පිළිවෙලක් වහාම ක්‍රියාවට නැංවීම.

• අත්‍යාවශ්‍ය ද්‍රව්‍ය නිෂ්පාදනයට සම්බන්ද කම්කරු පංතිය ඇතුලත් කර ගනිමින් එම ආයතන පාලනය කරනු ලබන සැපයුම් යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම.

• සේවකයින්ගේ ඡන්දයෙන් ප්‍රජාතන්ත්‍රවාදීව තෝරා පත් කර ගන්නා ලද කම්කරු කමිටු වල අධීක්ෂණය යටතේ සියලුම අත්‍යවශ්‍ය භාණ්ඩ සඳහා මිල පාලනයක් හඳුන්වා දීම.

• අත්‍යාවශ්‍ය ආහාර සහ අනෙකුත් භාණ්ඩ නිෂ්පාදනය නවීකරණය කිරීමට උපකාරී වීම සඳහා කර්මාන්ත දියුණු කිරීම වෙනුවෙන් දේශීය කර්මාන්ත සඳහා ආයෝජනය වැඩි කිරීමට පියවර ගැනීම.

• ප්‍රාග්ධනය විදේශ රට වලට ගලායාම නතර කිරීම සඳහා වන ප්‍රාග්ධන පාලන ක්‍රමවේදයක් හඳුන්වා දීම.

• ජනතාව පීඩනයට පත් කරන Vat බදු ප්‍රතිපත්තිය වහා සංශෝධනය කරන අතර සුපිරි ධනවත් පුද්ගලයන් මත විශේෂිත ධන බද්දක් පැනවීම හා ඔවුන් විසින් බදු නොගෙවීම වළක්වා ගැනීම සඳහා අවශ්‍ය කඩිනම් පියවර ගැනීම.

• සියලු මාදිලියේ රාජ්‍ය දූෂණය අවසන් කිරීමට තීරණාත්මක පියවරයන් ගත යුතු අතර - රාජපක්‍ෂ පවුල හා මහ බැංකු කොල්ලය වැනි දේශපාලන අධිකාරිය විසින් කොල්ලකන ලද සියලු ධනය රාජසන්තක කිරීම.

• 30 වසරක යුධ කාලයේදී සහ පසුගිය ගෝල්ෆේස් අරගලයේදී මෙන්ම ඉන්පසුව රනිල් - රාජපක්‍ෂ ආණ්ඩුව විසින් සිදු කරන ලද මර්දනය සහ සාහසික ක්‍රියා පිළිබඳ විමර්ෂනය කිරීමට ජාත්‍යන්තර මානව හිමිකම් සංවිධාන හා වෘත්තිය සමිති නියෝජිතයන් ඇතුලත් මහජන විනිශ්චය සභාවක් පිහිටුවීම.

• රාජ්‍ය අංශය විධිමත් කිරීම සැලසුම් කරමින් අධ්‍යාපනය සහ සෞඛ්‍ය සඳහා ප්‍රමාණවත් අරමුදල් වෙන් කරන අතර අධ්‍යාපනය සහ සෞඛ්‍යය සම්පූර්ණයෙන්ම නොමිලේ ලබා දීමට කටයුතු කිරීම.

• පරිසරය ආරක්ෂා කිරීමට අවශ්‍ය පියවර ගනු ලබන අතර පරිසර හිතකාමී ආයෝජන ප්‍රවර්ධනය කිරීම හා තිරසාර සැලසුම් සහගත දිගු කාලීන ආර්ථිකයක් සඳහා සැලසුම් කර පරිසරයට අහිතකර සියලුම ව්‍යාපෘති අවලංගු කිරීම.

• විදේශ වෙළඳාම සහ රාජ්‍ය ප්‍රතිපත්ති ප්‍රාග්ධනයේ අවශ්‍යතාවයන් සඳහා නොව මහජනතාවගේ යහපත සඳහා විය යුතු අතර ජාත්‍යන්තර සහයෝගීතාවය මත පදනම් වූ ස්වාධීන විදේශ ප්‍රතිපත්තියක් සැකසීම.

• රටට අවශ්‍ය කරන ආහාර භෝග නිෂ්පාදනය සඳහා ගොවි ජනතාවට අවශ්‍ය ඉඩම්, ජලය හා පොහොර පහසුකම් ලබා දීම සඳහා ගොවි නියෝජිතයින් ඇතුලත් මෙහෙයුම් කමිටු දිස්ත්‍රික්ක මට්ටමින් පත් කර ඒවා පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය පහසුකම් රජය මගින් සැපයීම.

• සේවක අර්ථසාදක අරමුදල (EPF) හා සේවක භාරකාර අරමුදල (ETF) වැනි කම්කරු පංතියට අයත් අරමුදල් ආයෝජනය කිරීම හා පාලනය කිරීම සඳහා වෘත්තිය සමිති නියෝජිතයින් ඇතුලත් කමිටුවක් මගින් තීන්දු ගැනීම.

## ප්‍රජාතන්ත්‍රවාදයේ ආරක්‍ෂාව සඳහා

• විධායක ජනාධිපති ක්‍රමය වහා අහෝසි කර මන්ත්‍රීවරු තෝරා පත් කිරීම සඳහා කොට්ඨාශ මට්ටමින් හා ඡන්ද අනුපාත අනුව පත්වන ක්‍රමයක් හඳුන්වාදීම.

• කුරිරු ත්‍රස්ත නීතිය සහ සමාජ මාධ්‍ය විරෝධී නීති ඇතුළු සියලුම ප්‍රජාතන්ත්‍ර විරෝධී නීති වහාම අහෝසි කිරීම.

• සමාන වැටුප් ලබා ගැනීම ඇතුළු සියලුම කාන්තාවන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමට පියවර ගැනීම.

• ආගම ඇදහීමේ අයිතිය සහ ආගමක් නොඇදහීමට ඇති අයිතිය ආරක්ෂා කිරීම හා මුස්ලිම් ජනතාවගේ ආගමික නිදහසට ඇතිවන බාධා ඉවත් කරමින් සියලු ආගම් රාජ්‍ය පාලනයෙන් සහමුලින්ම නිදහස් කිරීම.

• LGBTQ+ ප්‍රජාව සඳහා සියලුම හිමිකම් වලට ඉඩ සැලසීම.

• ස්වාධීන මාධ්‍යයක් බිහි කිරීම සඳහා ප්‍රාග්ධන හිමි ධනවතුන්ගේ පාලනයෙන් තොර වූ මාධ්‍ය සේවකයින්ගෙන් තේරී පත් වූ නියෝජිතයින්ගේ කමිටු මගින් ස්වාධීන මාධ්‍ය සදාචාරයක් බිහි කිරීම සමග මාධ්‍ය නිදහස, අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස, ඇතුලු සියලු ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් තහවුරු කිරීම.

• අධිරාජ්‍යවාදී බලවතුන් විසින් ගෙන යන යුද්ධ හරහා රටවල් හා ප්‍රදේශ බලහත්කාරයෙන් අල්ලා ගැනීම් වලට එරෙහි වෙමින් ලෝකවාසී සියලුම කම්කරුවන් හා පීඩිත ජනතාව අතර ජාත්‍යන්තර සහයෝගීතාවය ගොඩනැගීමට පියවර ගැනීම.

• බහුජන ව්‍යාපාරය විසින් සංවිධානය කරනු ලබන විප්ලවවාදී ව්‍යවස්ථාදායක සභාවක් ගොඩනගන අතර සෑම ජන කොටසකටම පිළිගත හැකි නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් පිළිබඳ නැවුම් සංවාදයක් ආරම්භ කිරීමට කටයුතු කිරීම.

## කම්කරු අයිතිවාසිකම් තහවුරු කිරීම

• කඳුකරයේ කම්කරුවන් ඇතුළු සියලුම කම්කරුවන්ගේ වැටුප් උද්ධමනයට ගැලපෙන අයුරින් වහා වැඩි කිරීම සහ අවම වැටුපක් ස්ථාපිත කිරීම සමග සතියකට පැය 35කට සීමාවූ වැඩ මුරයක් ක්‍රියාත්මක කිරීම.

• සියලුම වෘත්තීය සමිති විරෝධී නීති අහෝසි කර සියලුම සේවකයන්ට වෘත්තීය සමිතියකට බැඳීමට තිබෙන මූලික අයිතිය තහවුරු කිරීම.

• සියලුම සේවා ස්ථානවල සේවක කමිටු ගොඩනැගීම සඳහා වෘත්තීය සමිති මූලිකත්වය ගත යුතු අතර ප්‍රජාතන්ත්‍රවාදීව තෝරා පත් කරගත් එකීකමිටු ඒකාබද්ධ කර ගත් වෘත්තීය සමිතිවල ජාතික සම්බන්ධීකරණ කමිටුවක් පිහිටුවීමට පියවර ගැනීම.

• සියලුම කම්කරුවන්ගේ රැකියා සුරක්ෂිතභාවය සහතික කිරීම හා රැකියා උත්පාදනය කිරීම සඳහා සියලුම ප්‍රධාන අංශවල ආයෝජන සමග සම්බන්ධීකරන මධ්‍යස්ථානයක් ඇති කිරීම.

## ජාතික ප්‍රශ්නය විසඳීම සඳහා ප්‍රවේශය

• සියලුම දේශපාලන සිරකරුවන් කොන්දේසි විරහිතව වහාම නිදහස් කිරීම.

● අතුරුදන් වූවන් සම්බන්ධයෙන් කඩිනම් විමර්ශනයක් සිදු කර එමගින් ලැබෙන සියලු තොරතුරු ප්‍රසිද්ධියට පත් කිරීම.

● සිවිල් කටයුතු සඳහා හමුදා සහභාගීත්වය වහාම නැවැත්විය යුතු අතර සිවිල් ප්‍රදේශවලින් හමුදාව ඉවත් කිරීමට පියවර ගැනීම.

● බලහත්කාරයෙන් අල්ලාගෙන සිටින සියලුම ඉඩම් එහි මුල් අයිතිකරුවන්ට නිදහස් කිරීමට කටයුතු කරන අතර ඉඩම් නොමැති සැමට වගා කිරීම සඳහා ඉඩම් ලබා දීම.

● ජාතික ප්‍රශ්නය විසඳීම සඳහා ආරම්භක පියවරක් ලෙස 13 වන ව්‍යවස්ථා සංශෝධනය සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක කර බලය බෙදා ගැනීමේ ක්‍රියාවලිය පණ ගැන්වීම.

● ජාතික ප්‍රශ්නය විසඳීමේ පදනම ලෙස දෙමළ ජනතාවගේ ස්වයං නිර්ණ අයිතිය පිළිගැනීම.

● නීති පොතට සීමාවී පවතින ජාතික භාෂාවක් ලෙස දෙමළ භාෂාව භාවිතා කිරීමේ අයිතිය සමස්ථ ලාංකීය සමාජය තුල සමාන තත්වයකින් භාවිතා කිරීමට අවශ්‍ය පියවර ගැනීම.

● කඳුකරයේ ජනතාවට තමන්ගේම නිවසක අයිතිය තහවුරු කරන අතර අනෙකුත් ප්‍රධාන ප්‍රජාවන් හා සමානව කඳුකරයේ ජනතාව වෙනමම අනන්‍යතාවයක් සහිත නිදහස් ශ්‍රී ලාංකික ජන කොටසක් ලෙස පිළිගැනීම.

● සියලු සම්පත් සමාජයේ යහපත සඳහා යොදා ගැනීම වෙනුවෙන් වැඩ කරන ජනතාව විසින් සංවිධානය කරන ලද ප්‍රජාතන්ත්‍රවාදී නිෂ්පාදන සැලැස්මක් ක්‍රියාත්මක කළ හැකි සමාජවාදී සමාජයක් පිහිටුවීම සඳහා කම්කරු පන්තියේ ඒකාබද්ධ අරගලයක් වෙනුවෙන් එක්සත් සමාජවාදී පක්ෂය පෙනී සිටියි.

**සියලුම මැතිවරණවලදී එසප අපේක්ෂකයන් ලෙස ඉදිරිපත් වන දේශපාලන නියෝජිතයින් විසින් සහතික කරන ප්‍රධාන පොරොන්දු කීපයක්**

⋆ මහජන නියෝජිතයින්ගේ වැටුප ඃ- ඡන්දයෙන් තෝරාපත් වන අපගේ සියලුම අහෝසි දේශපාලන නියෝජිතයන් පුහුණු කම්කරුවන්ගේ වැටුපකට සීමා වීම හා අනවශ්‍ය මන්ත්‍රි වරප්‍රසාද ලබා ගැනීම කිරීම හා ඉතිරි වන වැටුප් සියල්ලම සමාජය වෙනස් කිරීමේ පොදු අරගලය ගොඩනැගීමේ කාර්යයට වෙන් කිරීම.

⋆ පාරදෘශ්‍යභාවය ඃ- අපගෙන් තෝරා පත් වන නියෝජිතයින්ගේ සියලුම වියදම් සහ ක්‍රියාකාරකම් සම්පූර්ණයෙන්ම පාරදෘශ්‍ය වන අතර මාසිකව පළ කරන අය වැය වාර්තාවක් මගින් මහජන පරීක්ෂාව සඳහා විවෘත කිරීම.

⋆ ආපසු කැඳවීමට තිබෙන අයිතිය ඃ- අපගේ නියෝජිතයින් පක්ෂය විසින් ප්‍රසිද්ධියේ ඉදිරිපත් කර තිබෙන පිළිගත් වැඩපිළිවෙල මත කටයුතු කරනු ඇත. තේරී පත් වන අපගේ නියෝජිතයා අපගේ වැඩසටහනේ සියලුම අංග ක්‍රියාත්මක කිරීම සඳහා පොරොන්දු වනු ඇත. එසේ කිරීමට අපොහොසත් වුවහොත් ඕනෑම අවස්ථාවක එලෙස තේරී පත් වූ නියෝජිතයා ආපසු නැවත කැඳවීමට සිදු කිරීමට පියවර ගනු ඇත.